**කරෙයිතිවු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කරෙයිතිවු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ කාර්යාලය සහ පුස්තකාලය පිහිටි සභාව සතු ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) පිරිවැය රු.5,400,000 ක් වූ සභාවේ ලොරි රථය 2012 වර්ෂයේදී අනතුරට පත් වී සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි. මෙම අනතුරට අදාළ සම්පූර්ණ වන්දි මුදල් සභාවට ලැබී තිබුණ නමුත් එම වාහනයේ පිරිවැය පොත්වලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී යූනෆ්ස් ආයතනයෙන් සභාවට ලබා දී තිබූ ගල්රෝල යන්ත්‍ර 02 (Road Roller) ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රඳවාගැනීමේ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රු.281,463 ක් වර්ෂ 07 කට අධික කාලයක සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර තැන්පතු ගිණුම්වල දිගින් දිගටම පෙන්වා තිබුණි.

(ආ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.39,897 ක ණය ශේෂ වර්ෂ 11 කට අධික කාලයක සිට හිඟ හිටව පැවතුණද එය අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

### 1.3.3 ලේඛනගත සාක්ෂි නොවීම

සභාව විසින් ඉදිරිපත් කළ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2007 වර්ෂය අනුව ඉදිරියට ගෙන එනු ලැබූ විෂයයන් 05 ක ගිණුම් ශේෂ එකතුව රු.9,026,950 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වන වගන්ති | - | ප්‍රාදේශීය සභාවේ කටයුතු සරල කිරීමේ අරමුණින් නිවැරදි තීරණ ලබාගැනීම සඳහා සභාවේ මූල්‍ය හා ප්‍රතිපත්ති සැලසුම්, නිවාස ඉදිකිරීම් සහ සමාජ සංවර්ධන, තාක්ෂණික සේවා, පාරිසරික සහ පොදු පහසුකම් යනාදී විෂයයන් සඳහා වෙනම කණ්ඩායම් ස්ථාපිත කර ඒවා ක්‍රියාවට නැංවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතීන්වල I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | - | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම ආදිය නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 1,781,197 | තැන්පතු 07 ක් වර්ෂ 02 කට අධික කාලයක සිට ඉකුත් තැන්පතු වශයෙන් දක්නට ලැබුණත්, සභාව විසින් අදාළ පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,443,891 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,458,867ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,902,758ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 25,000 | - | - | - | 15,000 | 20,000 | 20,000 | - |
| (ii) | කුලී | 2,550,000 | 2,880,096 | 2,901,026 | 652,725 | 2,050,000 | 2,882,523 | 3,022,523 | 673,655 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,558,000 | 1,094,903 | 1,089,334 | 3,737,696 | 2,903,000 | 1,047,556 | 1,225,849 | 3,732,127 |
| (iv) | අනෙකුත් ආදායම් | 5,560,000 | 2,649,033 | 2,649,033 | - | 5,288,000 | 6,566,810 | 6,411,116 | 285,694 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළ යුතු ආදායම් රු.11,029,814 කින් සමාලෝචිත වර්ෂයේදී රු.6,639,393 ක් අයකර ගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 60% ක් වී පැවතුණි.

### 2.2.3 වරිපනම් හා බදු

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල ඇති ව්‍යාපාරික ස්ථාන 350 ක් සහ නිවාස 5,660 ක් මත 2003 වර්ෂයේ සිට වරිපනම් තක්සේරු කර ගාස්තු අයකිරීමට කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව ආසන්න වශයෙන් රු.3,000,000 ක ආදායමක් අහිමි කරගෙන තිබුණි.

### 2.2.4 කුලී ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා හිඟ හිටව පැවැති මස් කඩ බදු මුදල් රු.459,964 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමන්තුරේ ප්‍රාදේශීය සභාව, නින්දවූර් ප්‍රාදේශීය සභාව සහ කල්මුනේ මහ නගර සභාව විසින් ගෙන එනු ලබන කුණු කසල කාරෙයිතිවු ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩගසා වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව විසින් එළඹ තිබූ පොදු එකඟතාවයකට අනුව අයකළ යුතු ගාස්තු රු.3,732,127 ක් අයකිරීමට වර්ෂ 3 කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු අයකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා පනතේ සභාව විසින් ආදායම් අයකිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා නීතිගත කිරීමේ ප්‍රමාදය හේතුකොට දැන්වීම් පුවරු 85 ක් සඳහා අයකළ යුතු දැන්වීම් ගාස්තු වාර්ෂිකව අයකිරීමට නොහැකි වීමෙන් සභාව විසින් වාර්ෂිකව රු.95,000 ක් වටිනා ආදායමක් අහිමි කර තිබුණි.

(ආ) විදුලි සංදේශ කුළුණු 02 ක් වෙනුවෙන් බලපත්‍ර ගාස්තු රු.255,000 ක් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

### 3.1.1 තිරසර සංවර්ධන අරමුණු (SDG)

2017 වර්ෂයේ අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත 2030 වර්ෂය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන වැඩසටහනට අනුකූලව සෑම ආයතනයක්ම ක්‍රියාකළ යුතුය. එසේ වුවත්, මේ සම්බන්ධයෙන් ඉලක්කයන් හඳුනාගෙන එය සාක්ෂාත් කරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාරෙයිතිවු පොදු වෙළඳපොල ගොඩනැගිල්ල සහ සභාවේ ඝන අපද්‍රව්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල අයිතිය සභාවේ නමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ ලොරි රථය 2012 වර්ෂයේදී අනතුරට ලක් වී සම්පූර්ණයෙන් විනාශ වී තිබීම සම්බන්ධයෙන් රක්ෂණ ආයතනය විසින් රු.1,400,000 ක මුදලක් රක්ෂණ වන්දි ලෙස ගෙවීමට එකඟ වී තිබූ නමුත් 2014 වර්ෂයේදී රු.1,000,000 ක් පමණක් සභාවට ලබා දී තිබුණි. එසේ වුවද, අදාළ වාහනය රක්ෂණ ආයතනයට භාර දී ඉතිරි රු.400,000 ක මුදල අයකර ගැනීමට හෝ නැතහොත් අදාළ ලොරි රථය වෙන්දේසි මඟින් විකිණීමට හෝ සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා ගොඩනැගිලි ගිවිසුම් මඟින් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ගෙවා තිබූ රු.3,400,500 ක එකතු කළ අගය මත බදු පිළිබඳව සභාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම් දී නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

දින 180 ක තෘප්තිමත් සේවා කාලයක් සම්පූර්ණ කර ස්ථිර පත්වීම් ලිපි ලබාගත් කම්කරුවන් 08 දෙනෙකු තමන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 සැප්තැම්බර් 09 දින අවසන් කර තිබූ නමුත්, ඔවුන්ගේ සේවාව තහවුරු කිරීම සහ ඔවුන්ගේ තෙවන වැටුප් වර්ධනය ලබාදීම ආදිය 2018 මැයි 10 දින වන විටත් සභාව විසින් සිදුකර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු නැගෙනහිර වෙරළාසන්න සමාජ සංවර්ධන ව්‍යාපෘති (NECCDEP) මූල්‍යාධාර යටතේ රු.14,347,200 ක වියදමින් ඉදිකර 2009 වර්ෂයේදී සභාවට භාර දෙනු ලැබූ පොදු වෙළඳපොලේ කඩකාමර 20 ක් දක්නට ලැබුණත් එයින් කඩ කාමර 19 ක් ඉදිකළ දිනයේ සිට මේ දක්වා කිසිඳු අරමුණක් සඳහා භාවිතා නොකර වර්ෂ 09කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභාවේ ඉදිරිපස කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ සභාව විසින් රු.300,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් 2018 සැප්තැම්බර් 10 දින දක්වා ඉදිරි කාර්යාලය ස්ථාපිත කර නොතිබූ අතර 2017 නොවැම්බර් 26 දින මිලදී ගනු ලැබූ රු.190,000 ක් වටිනා ලී බඩු හා කාර්යාල උපකරණ භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) පුස්තකාල ක්‍රියාකාරකම් වැඩිකර පාඨකයින්ගේ දැනුම වර්ධනය කිරීමට පුස්තකාල සංවර්ධන කමිටු ප්‍රාදේශීය සභාව විසින් ස්ථාපිත කර තිබුණත්, එම කමිටුවේ ක්‍රියාකාරකම් සහ කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂයේ එක් වතාවක් පමණක් පවත්වා තිබුණි. තවද, මහජන පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම සඳහා රු.300,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත් රු.13,486 ක් වටිනා පොත් පමණක් මිලදී ගෙන තිබුණි.

**3.5 සංස්කෘතික ශාලාව සඳහා ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම**

---

සමාලෝචිත වර්ෂයේ හදිසි අවශ්‍යතා, කාලය නොමැති වීම සහ නොවැලැක්විය අවස්ථාවන් වැනි හේතූන් රහිතව සභාවේ සංස්කෘතික ශාලාවට රු.703,800 ක් වටිනා ප්ලාස්ටික් පුටු 600 ක් සෘජුවම සීමාසහිත රාජ්‍ය වානිජ විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි. මේ අනුව පුද්ගලික ආයතනයකින් ලැබී තිබුණු තොරතුරුවලට අනුව ප්ලාස්ටික් පුටුවක මිල රු.1,100 කට පැවති නමුත් රු.1,173 ක වටිනාකමකට මිලදී ගෙන තිබූ බැවින් සභාවේ අරමුදලින් රු.43,800 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

**4. පද්ධති හා පාලන**

---

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| පාලන ක්ෂේත්‍රය | | විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| | (ii) | නිෂ්කාර්යව පවතින වත්කම් උපයෝජනයට ගැනීම සඳහා කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම. |
| (ඈ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | භාණ්ඩවල මිල වනාහි සාධාරණ වූත් සසඳා බැලීමට හැකියාව ඇති අයුරිනුත් වීම. |